Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

## කාර්ය පත්‍රිකාව

- **නිපුණතාව 06** - **නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි**
- **නිපුණතා මට්ටම 6.4** - **දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.**
- **පාඩම** - **රට යකුම ශාන්තිකර්මයේ තොරතුරු විමසමු.**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) රටයකුම ශාන්තිකර්මය හඳුන්වන තවත් නමකි

(i) කුමාර සමයම
(ii) රිද්දියාගය
(iii) කඩවර කංකාරිය
(iv) සන්නි යකුම

(02) රට යකුම ශාන්තිකර්මය ප්‍රචලිතව පවත්නා නර්තන ශෛලීන් දෙක නම්

(i) මාතර හා රයිගම
(ii) බෙන්තර හා රයිගම
(iii) මාතර හා බෙන්තර
(iv) මාතර හා මිරිස්ස

(03) රට යකුම ශාන්තිකර්මය පැවැත්වීමේ ප්‍රධාන අරමුණකි

(i) වසංගත රෝග වලින් ආරක්ෂා වීමට
(ii) ගමට රටට සෙත් පැතීමට
(iii) සශ්‍රීකත්වය ලබා ගැනීමට
(iv) දරුවන් නොමැති කාන්තාවන්ට දරුවන් ලබා ගැනීමට

(04) මේ අතරින් රිද්දි බිසවුන් සත්දෙනාට අයත් නොවන නාමය නම්

(i) මුදුන් මාල
(ii) මනිමේකල
(iii) ගිරිමේකල
(iv) ඕන්කාර

(05) රට යකුම ශාන්ති කර්මයේදී පුද ලබන පිරිසට අයත් නොවන්නේ

(i) රිද්දි යක්ෂණීන්
(ii) රිද්දි බිසෝවරුන්
(iii) කිරිඅම්මාවරුන්
(iv) බණ්ඩාර දෙවිවරු

**හිස්තැන් පුරවන්න**

(01) රිද්දි බිසවුන් සත්දෙනා දරු ගැබ් ඇති වීමේ ප්‍රීතිය හේතුවෙන් දිය කෙළියට ගියේ .............................. .................................................................... ඇල්ලට ය.

(02) රිද්දි බිසෝවරු ඇල්ලෙන් පැන ජීවිත අහිමි කරගන්නේ ................................................................................. ..................... ස්පර්ශය නිසා කලකිරීමෙනි.

(03) රිද්දි බිසව් නොඉඳුල් සළුවක් වියා ........................................................................................................................... පූජා කළේ ය.

(04) රිද්දි බිසව් ඇල්ලෙන් පැන දිවි තොර ගත් පසු නැවත උපන්නේ .............................................................................. .......................................... ලෙස ය .

(05) රිද්දි බිසව් ඇල්ලෙන් පනින අවස්ථාවේ ....................................................................... විසින් එක් බිසවක් .................................................................................................. අල්ලා බේරා ගනු ලැබීය

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) රට යකුම ශාන්ති කර්මයෙහි කතා පුවත කෙටියෙන් දක්වන්න.

(02) රට යකුම පැවැත්වීමේ අරමුණු පිළිබඳව විමසීමක් කරන්න.

(03) සමාජ සහජීවනය වර්ධනය කෙරෙහි රට යකුම ශාන්තිකර්මයෙන් ලැබෙන පිටුවහල අගයමින් අදහස් ඉදිරිපත් කරන්න.

.